


# අපේ ක්‍රිකට් අර්බුදයෙන් අර්බුදයට

# විසඳුමක් නැද්ද?





**කරුණු කෙසේ වුවද වර්තමාන ක්‍රිකට් ක්‍රීඩාවේ බලධාරියා අර්ජුන රණතුංග ය. කලකට පෙර ඔහු එම තනතුර ලබා ගන්නා විට ඒ ගැන සුබවාදී ලෙස හා අසුබවාදී ලෙස අදහස් දැක්වූ අය බොහෝ විය. ඒ අතුරින් වර්තමානයේ ජය ලබා ඇත්තේ අසුබවාදී නිමිති පළ කළ අයයි. පසුගියදා පාර්ලිමේන්තුවේදී අර්ජුන ගේ හඬා වැටීම ඊට කදිම නිදසුනකි. ඔහු එහිදී පවසා සිටියේ ඔහුගේ සමහර නිලධාරීන් දූෂිත බවයි. ක්‍රිකට් ක්‍රීඩාවේ බලධාරියා එසේ ප්‍රකාශ කරන විට ක්‍රීඩාවේ ඉදිරි ගමන පිළිබඳ කවර නම් බලාපොරොත්තු තැබිය හැකි ද? ආයතනයක බලධාරියාට දූෂිතයන් බවත් කිරීමට බලයක් නැත්නම් ඔහු බලධාරියකු නොවන්නේ ය. ඔහු ඒ සඳහා චෝදනා කරන්නේ ක්‍රීඩා ඇමති වරයාට විය යුතු ය.**

ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩාව අර්බුදයකින් තොර වූ කාලයක් සිහියට නගා ගැනීමඉතා අපහසු කාර්යයකි. එවැනි කාල පරිච්ඡේදයක් අප පසු කර ඇත්නම් ඒ සුද්දන්ගේ කාලය විය යුතු ය. කෙසේ වෙතත් මොනම අර්බුද තිබුණත් ඒවාට නිසි පිළිතුරු සපයමින් ක්‍රිකට් ක්‍රීඩාව ඉදිරියට තල්ලු කර ගෙන ආ යුගයක් හැටියට සිහියට නැගෙන්නේ ගාමිණී දිසානායක ගේ කාලයයි. එතැන් පටන් කලින් කලට ඉහළ පහළ යමින් කැරකුණ ක්‍රිකට් ක්‍රීඩාව නිමක් නැති අර්බුද මෙන්ම සුවිශේෂ ජයග්‍රහණ ද දැකිය හැකි වුව ද ඒකාකාරී බවකින් ඉදිරියට ගමන් නොකළේ ය. වෙන කවරදාටත් වඩා ක්‍රිකට් ක්‍රීඩාව සමග මුදල් ගලාගෙන ඒම මීට ප්‍රධාන හේතුව ලෙස සඳහන් කළ හැකි ය. එනිසාම ව්‍යාපාරිකයන් පැරණි ක්‍රිකට් ක්‍රිඩකයන් හා දේශපාලකයන් ඉතා ගිජු ලෙස ක්‍රිකට් පරිපාලනය බාර ගැනීමට සටන් වැදුණේ ඉතා තියුණු ක්‍රිකට් කරගයක සටන්කාමීත්වයටත් වඩා වැඩි සටන්කාමීත්වයක් පෙන්වමින් ය.

කරුණු කෙසේ වුවද වර්තමාන ක්‍රිකට් ක්‍රීඩාවේ බලධාරියා අර්ජුන රණතුංග ය. කලකට පෙර ඔහු එම තනතුර ලබා ගන්නා විට ඒ ගැන සුබවාදී ලෙස හා අසුබවාදී ලෙස අදහස් දැක්වූ අය බොහෝ විය. ඒ අතුරින් වර්තමානයේ ජය ලබා ඇත්තේ අසුබවාදී නිමිති පළ කළ අයයි. පසුගියදා පාර්ලිමේන්තුවේදී අර්ජුන ගේ හඬා වැටීම ඊට කදිම නිදසුනකි. ඔහු එහිදී පවසා සිටියේ ඔහුගේ සමහර නිලධාරීන් දූෂිත බවයි. ක්‍රිකට් ක්‍රීඩාවේ බලධාරියා එසේ ප්‍රකාශ කරන විට ක්‍රීඩාවේ ඉදිරි ගමන පිළිබඳ කවර නම් බලාපොරොත්තු තැබිය හැකි ද? ආයතනයක බලධාරියාට දූෂිතයන් බවත් කිරීමට බලයක් නැත්නම් ඔහු බලධාරියකු නොවන්නේ ය. ඔහු ඒ සඳහා චෝදනා කරන්නේ ක්‍රීඩා ඇමති වරයාට විය යුතු ය. එසේ නම් ක්‍රීඩා ඇමතිවරයා දූෂිතයන් ආරක්සා කරන තවත් දූෂිතයකු බව පාර්ලිමේන්තු සභා ගැබ තුළදීම ඔහුගේ පක්ෂයේ සගයකු පවසන විට දී ක්‍රිකට් ක්‍රිඩාව ගැන තබා සමස්ථ ශ්‍රී ලාංකේය ක්‍රීඩා ක්ෂෙත්‍රය ගැනම කිනම් බලාපොරොත්තුවක් අපට තැබිය හැකිවේද?

අනෙක් අතට ශ්‍රී ලංකාවේ සාමාන්‍ය සිරිත ලෙස බලයට පත්වූවන් නිතරම කලින් බලයේ සිටි අයට චෝදනා කරමින් දූෂන හා අක්‍රමිකතා වසා ගැනීමට උත්සාහ දරති. එහෙත් අර්ජුන එයට වෙනස් පිලිවෙතක් අනුගමනය කරමින් දනට බලයේ සිටින අයට චෝදනා ඒල්ල කිරීම සුවිශේෂ ය. එපමණක් නොව අර්ජුන කොතරම් ක්‍රිකට් ක්‍රීඩාවේ අත්දැකීම් හා පළපුරුද්ද ඇති අයකු වුව ද කණ්ඩායම සමගවත් යහපත් සබඳකම් නොපැවැත්වීම කණගාටුවට කරුණකි. එපමණක්ද නොව අද ක්‍රිකට් ක්‍රීඩාවේ ඉහළම ප්‍රගතියක් ලබාඇති ඉන්දියාව සමගද මතභේද හදා ගැනීම අභාග්‍යයකි. රාජ්‍යතාන්ත්‍රික වශයෙන් ජාත්‍යන්තර සබඳකම් පැවැත්වීමට තරම් පුහුණුවක් හෝ අධ්‍යාපනයක් හෝ මෙවැනි රටවල් සමග ගනුදෙණු කිරීමේ දී අත්‍යවශ්‍ය බව පසුගිය දින ශ්‍රෙෂ්ඨාධිකරණය රටේ ඉහළම ආයතනයක් පාලනය කළ අසන්තද මැල් නම් වන හිටපු ක්‍රිකට් ක්‍රීඩකයාට ලබා දුන් නඩු තීන්දුවෙන් ඉතා මනාව පැහැදිලි වන කරුණකි. ක්‍රීඩාවෙන් පමණක් නොව රටක් ජාතියක් ලෙස මොනම ආකාරයකින් හෝ ඉදිරියට යාමට නම් සුද්සුසාට සුදුසු තැන ලබා දිය යුතු ය.

"යා දෙක නොරත රත - එකට පෑහීමක් නැත" කීවාක් මෙන් ක්‍රීඩා ඇමති හා අර්ජුන රණතුංග අතර පෑහීමක් නැති නිසාම ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීමට සැබෑ ඕනෑ කමකින් අර්ජුන ගන්නා තීරණ වලට පවා හරස් වන්නට ඇමතිවරයා පසුබට නොවන අවස්ථා පසුගිය කාලයේ අපි දුටුවෙමු. කතාව එතැනින් නතර නොවන්නේ අර්ජුනගේ දෙවැනි ගමනට පෙර ක්‍රියාකලාපය නැවත වරක් ක්‍රියාත්මක කිරීමට අර්ජුන වෙර දරන බවට චෝදනා එල්ල වීම නිසායි. අතීතයේදීද ක්‍රිකට් ක්‍රිඩාව සිය බූදලයක් ලෙස සළකමින් සහෝදර ඥාති සංග්‍රහ පවත්වමින් අර්ජුන ගෙන ගිය පාලනය කිසිවකුට අමතක නැත . ඔහුගේම වචන වලින් පවසන්නේ නම් මිලියන 500කට වඩා වැඩි ණය අයිරාවක් මත මේ වන විට ක්‍රිකට් ක්‍රීඩාව රැඳී ඇත . බිලියන් සංඛ්‍යාත ක්‍රිකට් ලෝලීන් පිරිසක් සමග දිනෙන් දින ඉදිරියට ඇදෙන ලෝක ක්‍රිකට් ක්‍රීඩාව ශ්‍රී ලංකාව තුළද ඉදිරියටම ගමන් කරනු දැකීම අපේ ඒකායන ප්‍රාර්ථනයයි. වාද බේධ මති මතාන්තර මැද ශ්‍රී ලංකාව ක්‍රිකට් ක්ෂෙත්‍රයේ තවත් සිම්බාබ්වේ රාජ්‍යයක් නොවේවා යන අපේක්ෂාවෙන් හෙට දවසේ ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවට ජය පතමින් මේ සටහන අවසන් කරමි.

අසෝක සිල්වා

*ශ්‍රී ලංකාවේ සිට*

Sponsored by
Kandy Food & Spices,
Hampton Park

---

*15 වන පිටුවෙන් (ඇදිසි)*

රණසිංහ සම්බන්ධයෙන් කුසල් කියනා සියලු කාරණා සත්‍ය බව සුනන්ද දනියි. රණසිංහ හා සම්බන්ධ කුසල් හෝ වෙනත් කිසිවකු හෝ නොදන්නා බොහෝ රහස් සුනන්ද දනියි. එනිසා ම කුසල් ගේ ඉල්ලීම නොසළකා හැරීමෙන් රණසිංහ ප්‍රදර්ශනය කළේ සිය කුහක වත බව සුනන්දට පැහැදිලි ය. පැහැදිලිව සිතා ගත නොහැකි කුමක් හෝ හේතුවක් නිසා රණසිංහ වින්ධ්‍යා රිදවන්නට තැත් කරන බවක් පෙනෙයි. වින්ධ්‍යා ගේ මුදු ගති ගුණ හමුවේ රණසිංහ දරදඬු වන්නේ කෙසේ දැයි සිතා ගන්නට සුනන්ද ට නොහැකි ය.

කිසිවකු පඩි පෙළ බැස එනු ඇසෙයි.

"කම්මැලි හිතුණ ද..?" වින්ධ්‍යා ඉහළ පඩියක නැවතී අසයි. සුනන්ද පිලිතුරක් දෙන්නට පෙර ඉතිරි පඩි කිපය බැස ආ ඕ සුනන්ද වාඩි වී සිටි පඩියේම වාඩි වෙයි. ".. කම්මැලි හිතුණ ද..?" ඕ නැවත අසන්නේ ගඟ දෙස බලාගත්වනම ය. ඇගේ කටහඬ වෙනස් ය. ඒ බව ඔහුට වහා දැනෙයි. සුනන්ද හිස හරවා ඈ දෙස බලයි. ඇගේ ඇස් රතුව ගොස් ඇත්තේ හැඬීමෙන් බව ඔහු දනියි. අලුත් කඳුලු බිඳුවක් ඇගෙ " කොපුල තෙමා ගලා යන්නේ ඔහු බලා සිටිය දී ම ය.

"අඬන්න එපා.." ඔහු කියන්නේ ඇගේ මුහුණින් සිය ඇස් ඉවතට ගන්නා අතර ය. ඔහුගෙ " දණහිස මත සිය දකුණත තැබූ වින්ධ්‍යා ඔහු දෙස හැරී බලයි. දෑස් ඈත කඳු පෙළ මත රැඳවා ගත්වන ම ඔහු දිග කල්පනාවක ය.

කොළඹින් පිටවන විට වේලාව උදෑසන අට පසුවන්නට ඇතැයි සුනන්දට සිතෙයි. ජිනදාස අවන්හලේ තේ බොන්නට වාහනය නතර කරන තෙක්ම වින්ධ්‍යා සිටියේ දිග කල්පනාවක ය.

"අප්පච්චි එක්ක කොළඹ එන හැමදාකම තේ බොන්න මෙතන නවත්තනවා.." වාහනයෙන් බසින අතර ඈ කිවා ය. නුවර ගෙන යන්නට රසකැවිලි මල්ලක්ම ඈ මිලට ගත්තා ය. "අම්ම ආසයි කලු දොදොල් කන්න.. ඔන්න මං ඔයාටත් එක්ක ගොඩක් ගන්නවා.. නුවර ගියාම කමු"

"කොළඹින් පිටත් වෙලා ටිකෙන් ටික නුවරට ළං වෙන කොට හිතට මහා නිදහසක් දැනෙනවා සුනන්දයියා.. ඒක තේරුම් කරන්න බැරි හැඟීමක්"

"තමන්ට හුරු පරිසරයෙදි හැමෝටම එහෙමයි.." ඔහු කීවේ ය.

"කොහෙ හරි දුර ගිහින් කොළඹට ළං වෙන කොට ඔයාටත් ඒ හැඟීමම එනව ද..?" ඇගෙ " ප්‍රශ්නයට දිය හැකි පිලිතුරක් ඔහුට එක වරම සිහිපත් නොවුණි.

"කොළඹ කියන්නෙ ප්‍රසන්න තැනක් නෙවි.. ඉඳ හිට එන අයටයි හැමදාම ඉන්න අයටයි කියලා ඒකේ වෙනසක් නැහැ.."

ඕ හිස ඇළ කොට සිනාසුණ සැටි ඔහුට මතක ය.

"මං පොඩි කාලෙත් ඉස්කෝල ඇරිල ආවම සමහර දවස් වලට මේ පඩිය උඩ වාඩි වෙලා ගඟ දිහා බලා ඉන්නවා.. හරිම පුදුමයි.. අද ඔයා හරියටම ඒ පඩියෙ වාඩි වෙලා ගඟ දිහා බලා ඉන්නවා දැක්කම මට පුදුම හිතුණ" වින්ධ්‍යා සිනාසෙන්නට උත්සාහ කරයි. ගඟ දෙසින් හමා එන සුළඟ ඇගේ කෙහෙරැල් දසත විසුරවයි.

"ඕක මට දෙන්න.." ඕ ඔහු යමක් කියන්නට පෙරම ඔහු අත තිබූ ජේර ගෙඩිය උදුරා ගනියි.

"හවසට අපි මාලිගාවට යං.." ඕ පඩියෙන් නැගිටින අතර කියයි. "...එන්න බත් කන්න.. මං ඒක කියන්නයි ආවෙ.. පහළට ආවාම ඒකත් අමතක වුණා.."

*ළබන කළාපයට*